# වැවිලි අමාත්‍යාංශය

**පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත**
**කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ**
**රාජ්‍ය අමාත්‍යාංශය**

## තල් සංවර්ධන මණ්ඩලය

# පුරප්පාඩු

## තල් සංවර්ධන මණ්ඩලයේ පහත පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් භාරගනු ලැබේ

### තනතුර: නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී

**ජ්‍යෙෂ්ඨ කළමනාකරු කාණ්ඩය සඳහා බඳවා ගැනීම:**

**සුදුසුකම්:**

**බාහිර බඳවා ගැනීම්:**

කළමනාකරණය/විද්‍යාව/කෘෂිකර්මය/රාජ්‍ය පරිපාලනය/ව්‍යාපාර පරිපාලනය පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූලික උපාධියක්

සහ

අදාළ ක්ෂේත්‍රය තුළ පශ්චාත් උපාධි සුදුසුකමක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

සහ

සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ සමාගමක **"කළමනාකරණ මට්ටමේ"** තනතුරක අවම වසර 15 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර බඳවා ගැනීම්:**

ඉහත සඳහන් කළ බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් ලබා තිබීම.
තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ කළමනාකරු (MM 1-1) කාණ්ඩයේ 1 ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක් (5) සම්පූර්ණ කර තිබීම.

**වයසඃ**

අවුරුදු 35 ට නොඅඩු අවුරුදු 55 ට නොවැඩි අයවළුන් විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත්:**

**සෑම අයදුම්කරුවෙක්ම:**

- i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
- ii. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතු ය.
- iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- iv. ප්‍රධාන කාර්යාලය යාපනයේ විය යුතු ය.

| | | |
|---|---|---|
| **වැටුප් කාණ්ඩය** | : | HM 1-1 |
| **වැටුප් පරිමාණය** | : | රු.80, 295/- - (2,270 x 15) – 114,345/- |
| **වයස** | : | අවුරුදු 35 ට නොඅඩු අවුරුදු 55ට නොවැඩි විය යුතුය උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවනු ඇත. |
| **බඳවා ගැනීමේ ක්‍රමය** | : | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් තුළින් සිදු කෙරේ. |

**අයදුම්පත්‍රඃ**

- ජීව දත්ත, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් අයදුම්පත්‍ර, ඔබේ සුදුසුකම් සනාථ කිරීමේ සහතික පත්‍රවල පිටපත් සමග යොමු කළ යුතු ය. රාජ්‍ය සේවය/සංස්ථා/මණ්ඩලවල දැනටමත් සේවයේ නියුතු අය තම අයදුම්පත්‍ර අදාළ ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතු ය.
- සියලුම අයදුම්පත්‍ර 2022.03.14 හෝ එදිනට පෙර **"සභාපති, තල් සංවර්ධන මණ්ඩලය, අංක 498, ගාලු පාර, කොළඹ 06"** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වේ නම් ඒ සම්බන්ධව බඳවාගැනීමේ බලධරයා විසින් තීරණය කරනු ලැබේ. මේ සම්බන්ධව කිසියම් හෝ බලපෑමක් කිරීම නුසුදුසු වීමට හේතු වෙනු ඇත.

**සභාපති,**
**තල් සංවර්ධන මණ්ඩලය,**
**අංක 498, ගාලු පාර,**
**කොළඹ 06.**